1.පාඩම හෝ ඒකකය- අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය

2.නිපුණතාවය 7.0 -සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදා බැලීම් කරයි.

3.නිපුණතා මට්ටම 7.2 - පාසල් පද්ධතිය තුළ භාවිත වන අපරදිග තූර්ය වාදක භාණ්ඩ පිළිබඳ විමසයි.

4.පෙර ඉගෙනුම් අවස්ථා/ශිෂ්‍යා කළ යුතු කාර්යයන් :

- ❖ මීට පෙර උගත් පාඩමේ සඳහන් වූ අපරදිග තූර්ය වාදක භාණ්ඩ වර්ගීකරණය ඔබේ මතකයට නඟා ගන්න.

උදාහරණ : පාසලේ අපරදිග තූර්ය වාදක කණ්ඩායම,ජාතික නිදහස් දින උත්සවයේ ගමන් ගත් අපරදිග තූර්ය වාදක කණ්ඩායමක්,රූපවාහිනිය හෝ අන්තර්ජාලය ඔස්සේ නැරඹූ අපරදිග තූර්ය වාදක කණ්ඩායමක්

- ❖ ඔබ අපරදිග තූර්ය වාදක භාණ්ඩ වල හඬ නිකුත් වන ආකාරය පිළිබඳ අධ්‍යයනය කර ගත හැකි පොත්පත්,Web Site , LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක පහත link ඔස්සේ නරඹන්න.

- Google - https://www.google.com/search?q=western+music+wind+instruments&rlz=1C1CHZN_enLK953LK953&sxsrf=ALeKk03uS7FFRYtDd3tbUwt882mK9Hu2HA:1628735211707&source=lnms&tbm=isch&sa=X&ved=2ahUKEwj49ee9t6ryAhWB7XMBHeCDCTEQ_AUoAXoECAEQAw&biw=1366&bih=657#imgrc=htHjIQpOL8xBcM
- Youtube - 1.-Trumpet වාදනයක් https://youtu.be/AFsObmomVFA

  2. Baritone වාදනයක් https://youtu.be/kjvuYlNLLtY

  3.Euphonium වාදනයක් https://youtu.be/VFyZuUcKfS0

  4.Tuba වාදනයක් https://youtu.be/YtDgMqQ6n8U

  5.Saxophone වාදනයක් https://youtu.be/Q97K7Kbioo0

  6.https://youtu.be/gwTeBP1kDu0

- ❖ අතිරේක පොත්/සඟරා :
  1.අතිරේක කියවීම් පොත- පෙරදිග සංගීතය-9 ශ්‍රේණිය
  2.ජානක බණ්ඩාර ජයලත් - පෙරදිග සංගීතය-9 ශ්‍රේණිය

❖ එසේ තාක්ෂණය ඔස්සේ නැරඹිය නොහැකි දරුවන් සඳහා නැරඹීමට පහත රූප සටහන් ඇතුළත් කියවීම් පත්‍රිකාව උපයෝගී කර ගන්න.

<u>කියවීම් පත්‍රිකාව</u>

බටහිර සංගීතයේ හඬතල ගණනාවක් භාවිත වේ.මෙසේ හඬතල කිහිපයක් භාවිත කිරීමට නම් ඒ ඒ හඬතලයට ගැළපෙන සංගීත භාණ්ඩ ද නිර්මාණය වී තිබිය යුතුය.මේ නිසා පහත්ම හඬතලයේ සිට ඉහළම හඬතලය දක්වා විහිදුණු සංගීත භාණ්ඩ විශාල ප්‍රමාණයක් බටහිර සංගීතයේ නිර්මාණය වී ඇත.

බටහිර තූර්ය වාදක කණ්ඩායමක වැඩි වශයෙන් ඇත්තේ පිඹීමේ භාණ්ඩය.ඒවා ප්‍රමාණයෙන් විවිධ වුවත් හැඩයෙන් සහ වාදන තත්ත්වයෙන් සහ වාදන තත්ත්වයෙන් බොහෝ දුරට එක සමානය.




ඇරෙන වැහෙන වැල් 3 කින් සියලුම ස්වර වාදනය කරනු ලැබේ.එකම ස්ථානයකින් ස්වර තුනක් වාදනය කරනු ලැබේ.එසේ කරනුයේ මුවට තබා පිඹීමේදී වේගය අඩු වැඩි කරමින්ය.මෙවැනි තවත් භාණ්ඩ වල ස්වර නිකුත් වන ආකාරය ද එක හා සමානය.




ට්‍රම්පට් එකේ හඬට වඩා පහළ හඬක් නිකුත් වන මෙය ට්‍රොම්බෝන් නමින් හඳුන්වයි.එහි ඇරෙන වැහෙන වැල් නොමැත.ඒ වෙනුවට Slide නම් කොටස ඉදිරියට ගෙන යාම හා පසු පසට ගෙන ඒම මඟින් ස්වර නිකුත් කරනු ලැබේ.ට්‍රම්පට් භාණ්ඩයේ මුවින් පිඹීමේ ක්‍රමය මෙම භාණ්ඩයටද අදාළ වේ.

.







Baritone (බැරිටෝන්) හා Euphonium(ඉයුෆෝනියම්) යන සංගීත භාණ්ඩවල හඬ ඉතා පහළය.මෙම භාණ්ඩ යුගලය වෙන් කොට හඳුනා ගැනීමට නොහැකි තරම් සමානය.මෙම භාණ්ඩ දෙකෙහි වෙනස වන්නේ Euphonium එකට වඩා Baritone භාණ්ඩය සුළු වශයෙන් විශාලය.ධ්වනි ගුණය එක සමානය.

මෙම භාණ්ඩ කුලකයේ පහළම හඬතලයේ ස්වර නිකුත් කරනුයේ Sousaphone (සෝසෆෝන්) හා Tuba (ටියුබා)යන භාණ්ඩ වලිනි.

එකම කුලකයක සංගීත භාණ්ඩ වන මේවායේ නාදය කරන ආකාරය හා පිඹීමේ ක්‍රමය හා පිත්තල ලෝහයෙන් නිර්මාණය විමසන කරුණ් එක සමානය.Brass wind නම් බාණ්ඩ වර්ගයට අයත්ය.පහත දැක්වෙන්නේ ඒවා වාදනය කරන ඉරියව්ය.








පහත දැක්වෙන්නේ wood wind  ගණයට අයත් භාණ්ඩ කිහිපයකි.




මෙම භාණ්ඩවල විශේෂත්වය වන්නේ පිඹීමේ ස්ථානය ඉපියාවකින් යුක්ත වීමය.

- එක් ඉපියාවක් ඇති (single reed)
- ඉපියා දෙකක් ඇති(Double reed)
- ඉපියා නැති(Reed less)
  ක්ලැරිනට් භාණ්ඩයද සොප්‍රානෝ ක්ලැරිනට් සහ බේස් ක්ලැරිනට් වශයෙන් ප්‍රමාණයෙන් වෙනස් ව දක්නට ඇත.

සැක්සෆෝන් නම් භාණ්ඩයද හඬතල අනුව නිර්මාණය වී ඇත.








ඕ බෝ (Oboe) නම් භාණ්ඩය ශ්‍රී ලංකාවේ හොරණෑවේ හඬට සමාන හඬක් ඇති wood wind ගණයට අයත් අපරදිග සංගීත භාණ්ඩයකි.මෙම සංගීත භාණ්ඩය ඉපියා දෙකකින් යුක්ත වන නිසා Double reed ගණයට අයත් වේ.

Percussion (සමාඝාත භාණ්ඩ)

Percussion භාණ්ඩ තාල වාද්‍ය හා ස්වර වාද්‍ය භාණ්ඩ වශයෙන් වර්ග දෙකකි.



Side Drum
Or

Tenor Drum







ස්වර වාද්‍ය භාණ්ඩ



Vibrophone(වයිබ්‍රෆෝන් )



5.මෙම සතිය තුළ නියමිත පාඩම්වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල :

- පාසල් පද්ධතියේ භාවිත වන අපරදිග සංගීත භාණ්ඩ නම් කරයි.
- ඒවායේ සම විෂමකම් දක්වයි.
- බටහිර සංගීත භාණ්ඩ රාශියක් ඇති බව පිළිගනියි.
- රූප සටහන් වෙන් කිරීමේ කුසලතාව ලබයි.

6.ඇගයීම්/තක්සේරුකරණ ක්‍රමවේද හා ආකෘති :

1.අපරදිග තූර්ය වාදක කණ්ඩායමක භාවිත වන සුෂිර සංගීත භාණ්ඩ සපයා ගත හැකි නම් විවේකය ගත කරන අවස්ථා වල ශුද්ධ ස්වර වාදනය කිරීමට පුහුණු වන්න.

2. අපරදිග තූර්ය වාදක කණ්ඩායමක භාවිත කරන සංගීත අතර වැල්ව් 3 ක් සහිත සංගීත භාණ්ඩ නම් කරන්න.

3.පහත දැක්වෙන සංගීත භාණ්ඩ වල නාද නිකුත්වන අයුරු සහ ස්වර වාදනය කරන ආකාරය අනුව සමාන අසමානකම් ලියා දක්වන්න.

Baritone ,Euphonium, Soursephone,Tuba Trumpt,Trombone,Clarinet,Oboe, Saxophone

පාඩම සැකසුම : නිවිතිගල අධ්‍යාපන කලාපය

සෞන්දර්ය අංශය